# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,484 — 1965 අගෝස්තු 18 වැනි බදාදා — 1965.8.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 31/47.
ප.පා.දෙ.—ජීබී 16/1/16.

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ඇමැතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමැති.

1965 අගෝස්තු 13 වැනි දින,
කොළඹ දීය.

#### ආඥාව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ, ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ මාදම්පේ ගම්ප්‍රදේශයට අදාලව සම්පාදිතව, මේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයේ (1) වැනි සහ (2) වැනි ඡේදවල වූ විධිවිධාන—

(1) ඉහත කී ගම් ප්‍රදේශයේ ගම් සභාවට සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස 1966 ජූනි 30 වන දිනට පෙර පැවත්වීමට නියමිත මහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් වූ යම් කරුණකට මේ විධිවිධාන අදළ වන ප්‍රමාණයට, මේ ආඥාව ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියාත්මක විය යුතුය ; තවද

(2) වෙන යම් කරුණකට මේ විධිවිධාන අදළවන ප්‍රමාණයට 1966 ජූලි 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

8-723/1

ඇල්.ඩී.—බී. 74/39.
ප.පා.දෙ.—ජීබී 16/1/16.

### ගම් සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම්, වන මම මෙයින්—

(1) මීට යාකොට ඇති උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව සඳහන් ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ මාදම්පේ ගම් ප්‍රදේශයේ දැනට පිහිටා තිබෙන ඇතැම් ඡන්ද කොට්ඨාශ එකී උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව සඳහන් සීමා සහිතව අවස්ථාවෝචිත පරිදි අතුරු කොටස්වලට බෙදා එක් කරමි ; තවද

(2) (1) වැනි ඡේදයේ විධිවිධාන—

(අ) ඒවා 1966 වර්ෂයේදී පැවැත්වීමට නියමිත එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීමේ මහා ඡන්ද විමසීමට සම්බන්ධවූ යම් කරුණකට අදාළ වන පමණට, මෙම ආඥාව ගැසැට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ; සහ

(ආ) මේ විධිවිධාන අන් කිසි කරුණකට අදාලවන ප්‍රමාණයට 1966 ජූලි මස පළමු වන දින සිට ක්‍රියාත්මක විය යුතු බවද

ප්‍රකාශකරමි.

ඇම් තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දීය.


601—ආර් 8068—5,000 (65/8)

## උපලේඛනය

### මාදම්පෙ ගම් ප්‍රදේශය

I වැනි තීරය — දැනට ඇති කොට්ඨාශ | II වැනි තීරය — අළුත් කොට්ඨාශ

**2. අකුරල දකුණ**

අංක 2 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත අකුරල I :—

උතුරට : මුහුදුවෙරළේ සිට ගල්දූව බස්නාහිර මායිමේ අකුරල වෙල දක්වා වැටී ඇති අකුරල දූව පාර.

නැගෙනහිරට : අකුරල වෙල සහ වේර ගොඩ ගම් ප්‍රදේශයට අයත් ගල්දූව ගමේ බස්නාහිර මායිම.

දකුණට : උඩුවරගොඩ ගමේ උතුරු මායිම.

බස්නාහිරට : මුහුදු වෙරළ.

**3. අකුරල උතුර**

අංක 3 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ අකුරල II —

උතුරට : මුහුදු වෙරලේ සිට වේරගොඩ ගම්ප්‍රදේශයේ සීමාව දක්වා වැටී ඇති ගල්දූව පාර.

නැගෙනහිරට : අකුරල වෙල සහ වේර ගොඩ ගම්ප්‍රදේශයට අයත් ගල්දූව ගමේ බස්නාහිර මායිම.

දකුණට : අංක 2 දරණ ඡන්ද කොට්ඨාශයේ අකුරල 1 උතුරු මායිම.

බස්නාහිරට : මුදු වෙරළ.

**5. උස්මුදලාව**

අංක 5 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත මාදම්පේ :—

උතුරට : මුදු වෙරළේ සිට වේනමුල්ලට හැරෙන ස්ථානයේ පිහිටි පුරාණ වන වාස විහාර පන්සලේ බස්නාහිර මායිම දක්වා වැටී ඇති උස්මුදලාව-මීටියාගොඩ පාර.

නැගෙනහිරට : කම්බුවත්ත හන්දිය දක්වා වේනමුල්ල රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර.

දකුණට :—වේනමුල්ල රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර.

බටහිරට : මුදුවෙරළ.

අංක 6 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත උස්මුදලාව :—

උතුරට : නිග්‍රෝධාරාම මාවත අවසානය දක්වා සහ එතැන් සිට සම්පත්ති වෙල මැදින් මීගහවත්ත පාරේ බෝක්කුව දක්වා.

නැගෙනහිරට : අන්තිමට සඳහන් ලක්ෂ්‍යයේ සිට මහරුප්ප හන්දිය දක්වා වූ මීගහවත්ත පාර.

දකුණට : මහරුප්ප හන්දියේ සිට ඡන්ද කොට්ඨාශ අංක 5 දරන මාදම්පෙ කොට්ඨාශයේ උතුරු මායිම.

බටහිරට : මුදු වෙරළ.

**6. ඌරවත්ත**
**7. ඉඩන්තොට**
**8. දේවගොඩ-දෙල්දූව**
**9. කුලීගොඩ**

අංක 7 දරන ඡන්ද කොට්ඨාශය—පහත සඳහන් පරිදි මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විත වැල්ලබඩ :—

උතුරට : මුදු වෙරළේ සිට ලුෂිත්වන් උද්‍යානයේ නැගෙනහිර බෝක්කුව දක්වා සුදුවැලිකඩ පාර.

නැගෙනහිරට : මුරුංගහවත්ත ඇලවැල්ලේ ඇලට සම්බන්ධ වන ස්ථානය දක්වා සහ වැල්ලේ ඇල නිග්‍රෝධාරාම පාර හමුවන ස්ථානය දක්වා.

දකුණට : ඡන්ද කොට්ඨාශ අංක 6 දරන උස්මුදලාව කොට්ඨාශයේ උතුරු මායිම.

බටහිරට : මුදු වෙරළ.

අංක 8 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත උස්වත්ත :—

උතුරට : මාදම්පා විල නොහොත් අම්බලන්ගොඩ නගර සීමාව.

නැගෙනහිරට : මාදම්පා විලේ ශාඛාවේ බස්නාහිර ඉවුර දිගේ ගල්කැටිය බෝගහවත්ත නාන තොටුපල ළඟ දක්වා සහ එතැන් සිට දුම්රිය පාර දිගේ එය සුදුවැලිකඩ පාර හමුවන ලක්ෂ්‍යය දක්වා.

දකුණට : අන්තිමට සඳහන් ලක්ෂ්‍යයේ සිට සුදුවැලිකඩ පාර ඔස්සේ මුහුදු වෙරළ දක්වා සුදු වැලිකඩ පාර.

බස්නාහිරට : මුහුදු වෙරළ.

අංක 9 දරන ඡන්ද කොට්ඨාශය— දෙල්දූව නමැති දූපතෙන් සමන්විත දෙල්දූව.

අංක 10 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විත දේවගොඩ :—

උතුරට : මාදම්පා ගඟේ ශාඛාව බෙදී යන ස්ථානයේ සිට මාදම්පා ගං ඉවුර දිගේ ඉඩන්තොට පන්සල වත්තේ නැගෙනහිර මායිම දක්වා.

නැගෙනහිරට : ඉඩම්තොට පන්සල වත්තේ නැගෙනහිර මායිම දිගේ බලබොක්ක පාර දක්වා සහ එතැන් සිට බලබොක්ක පාරේ ඉඩම්තොට ලියුම්කනුව හන්දිය දක්වා ඇඳි රේඛාවකින්.

දකුණට : ඉඩම්තොට ලියුම්කනුව හන්දියේ සිට දේවගොඩ මැද පාර ඉඩන්තොට පන්සර පාර හන්දිය දක්වාද, එතැන් සිට දේවගොඩ හන්දිය දක්වාද, එතැන් සිට දේව ගොඩ පන්සල පාරේ පහන් කනුව හන්දිය දක්වාද, එතැන් සිට බස්නාහිර දෙසට සුදුවැලි කඩ පාරේ රේල්ගේට්ටුව දක්වා.

බස්නාහිරට : අංක 8 දරණ ඌරවත්ත ඡන්ද කොට්ඨාශයේ නැගෙනහිර මායිම.

අංක 11 දරන ඡන්ද කොට්ඨාශය— පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත ඉඩන්තොට :—

උතුරට : ඉඩන්තොට-පන්සල පාර හමුවන හන්දියේ සිට ඉඩන්තොට ලියුම් කනුව හන්දිය දක්වා දේවගොඩ මැදපාරද, එතැන් සිට ඉඩන්තොට පන්සලේ නැගෙනහිර මායිම දක්වා බලබොක්ක පාර ද, එතැන් සිට පන්සල වත්තේ නැගෙනහිර මායිම ඔස්සේ මාදම්පා ගං ඉවුර දක්වා වූ රේඛාවකින්.

නැගෙනහිරට : අවසන් වරට සඳහන් ලක්ෂ්‍යයේ සිට ඉන් ඇල හමුවන ස්ථානය දක්වා මාදම්පා විලද, එතැන් සිට ඉන් ඇල දිගේ දුම්මල වත්ත ප්‍රසිද්ධ මන්සන්දිය අසල පිහිටි සුදුවැලි කඩ පාරේ පිහිටි ඉන් ඇල බෝක්කුව හමුවන තෙක් ඉන් ඇලද වේ.

දකුණට : අවසන් වරට සඳහන්වූ ස්ථානයේ සිට මඩම හන්දිය පසු කොට මීගහ හන්දිය දක්වා සුදුවැලි කඩ පාර ද, එතැන් සිට ඉන් ඇල බෝක්කුව දක්වා මීගහවත්ත පාරද එතැන් සිට සම්පත්ති ඇල හරහා නිග්‍රෝධාරාම පාරේ අවසානය දක්වා ඇඳි රේඛාවද වේ.

| I වැනි තීරය<br>දැනට ඇති කොට්ඨාශ | II වැනි තීරය<br>අළුත් කොට්ඨාශ |
|---|---|

බටහිරට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට වැල්ලේ ඇල මුරුංගහ වත්ත ඇලට සම්බන්ධවන තැන දක්වා සහ ලෂින්ටන් ක්‍රීඩාපිටිය අසල සුදුවැලිකඩ පාරේ පහන් කනුව හන්දිය දක්වා මුරුංගහවත්ත ඇල, එතැන් සිට දේවගොඩ හන්දිය දක්වා දේවගොඩ පන්සල පාර, එතැන් සිට දේවගොඩ මැද පාරේ සිව්මන් හන්දිය දක්වා ඉඩන්තොට පන්සල පාර.

**අංක 12 දරන ඡන්ද කොට්ඨාශය—පහත සඳහන් පරිදි මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විත විල්ලිගොඩ :—**

උතුරට : පුරාන වනවාස විහාර පන්සලේ බස්නාහිර මායිමේ වේන මුල්ලට හැරෙන හන්දියේ සිට මහ රුප්ප හන්දිය දක්වා උස්මුදුලාව-මීවිටියගොඩ පාරෙන්ද, එතැන් සිට මීගහවත්ත හන්දිය දක්වා මීගහ වත්ත පාරෙන්.

නැගෙනහිරට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට මඩම හන්දිය ඔස්සේ අම්බලන්වත්ත හන්දිය දක්වා සුදුවැලිකඩ පාරෙන්ද, එතැන් සිට බේකරිය හන්දිය දක්වා උස්මුදුලාව-මීවිටියගොඩ පාරෙන් ද, එතැන් සිට බස්නාහිර දෙසට වැටෙන පාරෙන්ද, එතැන් සිට තවදුරටත් අඳුරන්ගොඩ මැද්දුව වෙල දක්වා ඇදි රේඛාවකින්.

දකුණට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට අඳුරන්ගොඩ මැද්දුව වෙල ඔස්සේ මැද්දුව වෙලේ හන්දිය දක්වා.

බස්නාහිරට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට හම්බුවත්ත පාරෙන් හම්බුවත්ත හන්දිය දක්වාද, එතැන් සිට උතුරු මායිම ඇරඹිහ කළ ස්ථානය දක්වා වේනමුල්ල පාරෙන්.

8-723/2

**අංක 13 දරන ඡන්ද කොට්ඨාශය—පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත කුලීගොඩ :—**

උතුරට : හම්බුවත්තේ සිට ඉන් ඇල බෝක්කුව දක්වා සුදුවැලිකඩ පාරෙන් සහ එතැන් සිට මාදම්පා විල සම්බන්ධ වන ස්ථානය දක්වා ඉන් ඇලින්.

නැගෙනහිරට : අවසන් වරට සඳහන් ලක්ෂයයේ සිට අප්පල්ල වෙල්යාය දක්වා මාදම්පා විලෙන්.

දකුණට : අවසන් වරට සඳහන් කළ ස්ථානයේ සිට ගලගොඩ වෙල්යාය මැදින් ඕලුවලු මුල්ල පාර කෙළවර දක්වාද, එතැන් සිට ගොඩවාන හන්දිය දක්වාද ඇදි රේඛාවකින්.

බටහිරට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට මීවිටියාගොඩ උතුරු මායිම ආරම්භ කළ ස්ථානය දක්වා මීවිටියාගොඩ පාරෙන්.

**අංක 14 දරන ඡන්ද කොට්ඨාශය—පහත සඳහන් පරිදි මායිම්වූ ප්‍රදේශයෙන් සමන්විත රොන්නදූව :—**

උතුරට : හන්දියේ සිට කෙළවර දක්වා ගොඩවාන පාරෙන්.

නැගෙනහිරට : ඕලුවලමුල්ල පාරෙන්.

දකුණට : ඕලුවලමුල්ල පාරේ කෙළවර සිට වෙල්යාය මැදින් ගලගොඩ වත්තේ මුරපල ගේ විටුව දක්වා ඇදි රේඛාවකින් සහ එතැන් සිට මීවිටියා ගොඩ පාරෙන්.

බටහිරට : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට රොන්නදූව හන්දිය දක්වා උස්මුදුලාව-මීවිටියාගොඩ පාරෙන් එතැන් සිට රොන්නදූව වෙල හරහා අඳුරන්ගොඩ දක්වා ඇදි රේඛාවකින්, එතැන් සිට බේකරිය හන්දිය දක්වා සහ එතැන් සිට ගල්දූව හන්දිය දක්වා මීවිටියාගොඩ පාරෙන්.

**අංක 15 දරන ඡන්ද කොට්ඨාශය—ගලගොඩ වත්තෙන් සහ ජනපදයෙන් සමන්විත වේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි